# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01,

(i) ප්‍රමිතියේ 21(ඉ) වගන්තිය අනුව අදාල ආයතනයේ අනුමත අයවැය දත්ත සමඟ සත්‍ය දත්ත සන්සන්දනයක් හෝ මූල්‍ය ප්‍රකාශනවල අයවැය සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස ඉදිරිපත් කළයුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි.

(ii) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ශුද්ධ වත්කම් / ස්කන්ධය යටතේ සමුච්චිත අතිරික්තය හෝ ඌණතාවය සංචිතවලින් වෙන්කර දැක්විය යුතු වුවත් සමුච්චිත ඌණතාවය එසේ වර්ගීකරණයකින් තොරව පොදු සංචිතය සමග එකතු කර දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 02,

(i) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ඌණතාවය ගණනය කිරීමේදී පාදක කර නොගත් එකතුව රු. 64,693,041 ක් වූ අයිතම 03 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ගැලපුම් කිරීම හේතුවෙන් රු.27,364,799 ක මුදල් ගලා ඒමක් හා රු.37,328,242 ක මුදල් ගලා යාමක් වැඩිපුර දක්වා තිබුණි.

(ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන ක්‍රියාකාරකම් හා මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ රු.13,011,699ක් වූ අයිතම 02 ක මුදල් ගලා ඒම අඩුවෙන් ද, රු.62,864,463 ක් වූ එක් අයිතමයක මුදල් ගලා යාම වැඩියෙන්ද දක්වා තිබුණි.

(iii) ශුද්ධ ඌණතාවයට ගැලපිය යුතු ජංගම වගකීම් ශේෂය වැඩි වීම රු.3,136,008 ක් වුවත් රු.2,404,193 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා තිබීම හේතුවෙන් මුදල් ගලා යාම රු. 731,815 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(iv) මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනයේ 2012 වර්ෂයට අදාළ පාරිතෝෂික වෙන්කිරීම් වටිනාකම රු.15,395,535 ක් වූ අතර, මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ශුද්ධ ලාභයට එය රු.14,886,506 ක් ලෙස ගලපා තිබීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් ගලා ඒම රු. 509,029 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බුත්තල හා රහංගල පිහිටි අධ්‍යයන පීය 2006 වර්ෂයේදී සබරගමුව විශ්වවිද්‍යාලයට පවරා ගෙන එහි තිබූ දේපල, පිරියත හා උපකරණවල වටිනාකම වූ රු.63,173,244 ක් ප්‍රාග්ධනිත කිරීම වෙනුවට වත්කම් ප්‍රත්‍යාගණනය ගිණුමට බැර කර තිබුණි. 2006 වර්ෂයේ සිට විගණනයෙන් පෙන්වා දී තිබූ මෙම වැරදි සටහන් කිරීම 2012 වර්ෂය අවසාන වන තෙක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 සැප්තැම්බර් 25 දින ප්‍රත්‍යාගණනය කරන ලද වාහනවල වටිනාකම 2012 වර්ෂයේදී ගිණුම්ගත කර තිබුණු අතර, ප්‍රත්‍යාගණන වටිනාකම මත 2011 වර්ෂයට අදාල ක්ෂය ගැලපීමේදී ප්‍රත්‍යාගණන දිනයේ සිට ගැලපීම් සිදු නොකර 2011 මුළු වර්ෂයටම ක්ෂය ගණනය කර රු.5,297,730 ක් පොදු සංචිතයට හර කර තිබුණි.

1.2.3 ලැබිය යුතු ගිණුම්

විශ්වවිද්‍යාල සේවකයින් 13 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු.1,340,190 ක් වූ සේවක ණය මුදල් 2013 ජුනි 15 දින වන විටද අයකර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම ණය අර්ථසාධක අරමුදලින් අයකරගන්නා බව උපකුලපති තුමා දන්වා ඇත.

1.2.4 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කෙරේ.

| නීතිරීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | විගණනයට ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් ලේඛණය අදාල චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව සකස් කර නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංකIAI/2002/02 දරන චක්‍රලේඛය | පරිගණක උපකරණ සම්බන්ධ ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (iii) 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009 (2) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | ස්ථාවර වත්කම් නඩත්තුව සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්යය පරිපාටිය චක්‍රලේඛයෙහි දක්වා තිබුණද ඒ සම්බන්ධව නිසි අවධානය යොමු කර නොතිබුණි. |
| (ආ) 2010 දෙසැම්බර් 17 දිනැති PF/ සමීක්ෂණ මණ්ඩල අංක 01 දරන | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු ඊළඟ වර්ෂයේ මාර්තු 15 දිනට ප්‍රථම සිදුකර ඊට |

| | |
|---|---|
| ලිපියෙන් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2011 හා 2012 වර්ෂවලට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2013 ජුනි 24 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ)1989 ඔක්තෝබර් 25 දිනැති අංක 408 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | යථෝක්ත චක්‍රලේඛයට පටහැනිව මහාචාර්යවරයෙකුට සප්ත වාර්ෂික නිවාඩු මාස 08 ක් වැඩිපුර ලබාදීම හා ඊට සමගාමීව ලබාදෙන ගුවන් ටිකට් පත් සඳහා රු. 214,800 ක් ලබාදීමට විශ්වවිද්‍යාලයට සිදුවී තිබුණි. මෙලෙස විශ්වවිද්‍යාලයට සිදුවූ මූල්‍යමය අලාභය අදාල මහාචාර්ය-වරයාගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණ ද එයට එරෙහිව ඔහු විසින් නඩුවක් ගොනුකර තිබුණි. උක්ත නිවාඩු සාවද්‍ය ආකාරයෙන් ගණනය කර, අනුමත කරන ලද නිලධාරීන්ට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.677,230,009 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ ඌණතාවය රු.565,899,027 ක් විය. පුනරාවර්ථන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.580,597,980 ප්‍රදානය හේතුකොට ගෙන සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.96,632,029 දක්වා අඩු වී තිබුණු අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.458,946,140 වූ රජයේ ප්‍රදානය හේතුකොට ගෙන එම වර්ෂයේ ඌණතාවය රු.131,450,782 ක් වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 34,818,753 කින් වර්ධනය වී තිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ පීඨ 05 හි අධ්‍යාපනය ලැබූ ශිෂ්‍යයන් 3,164 දෙනෙකු සඳහා රු.575,946,435ක් ද, ඊට අනුරූපව පසුගිය වර්ෂයේ ශිෂ්‍යයන් 3,774 දෙනෙකු සඳහා රු.490,177,119 ක් පුනරාවර්තන වියදම් ලෙස වැය කර තිබුණි. ඒ අනුව ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| පීඨය | ඒක ශිෂ්‍ය පිරිවැය |
|---|---|

| | 2012 | 2011 |
|---|---|---|
| කෘෂි විද්‍යා පීඨය | 309,714 | 211,626 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 174,344 | 121,467 |
| කළමනාකරණ පීඨය | 139,669 | 101,608 |
| සමාජ විද්‍යා පීඨය | 184,353 | 127,366 |
| භූ විඥාපන පීඨය | 223,987 | 173,834 |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කරනු ලැබ ඇති නිලධාරිණියක් විසින් සේවය අත්හිටුවීම සම්බන්ධව සබරගමු කලාප කම්කරු කොමසාරිස් වෙත පැමිණිල්ලක් කළද එම පරීක්ෂණය සඳහා විශ්වවිද්‍යාලය නියෝජනයට කිසිදු අයෙකු සහභාගි නොකිරීම තුළින් විශ්වවිද්‍යාලයේ අයිතිවාසිකම් අත්හැරීමක් කර තිබුණි. අනතුරුව කම්කරු කොමසාරිස් ලබාදුන් ඒකපාර්ශ්වික නිර්දේශයට එරෙහිව විරෝධතා ගොනුකළ හැකිව තිබුණද එසේ කිරීමක්ද කර නොතිබුණි.

(ආ) වටිනාකම රු. 244,221,885 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවල නීත්‍යානුකූල හිමිකම සනාථ කිරීමට අදාල ලියවිලි විගණනය වෙත ඉදිරිපත් නොකෙරිණි.

(ඇ) අමාත්‍ය මණ්ඩලය විසින් 2005 අගෝස්තු 24 දිනැති අංක 2005/ED/HE/56 දරන අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් අනුමත කරන ලද තොරතුරු තාක්ෂණ ගොඩනැගිල්ල, කාන්තා නේවාසිකාගාරය සහ 2005 මැයි 24 දිනැති අංක 05/0600/035/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමට අනුමැතිය ලබා දී තිබුණි. 2013 ජූනි 30 දින වන විටද කිසිදු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ආරම්භ කර නොතිබියදීත් ඒ වෙනුවෙන් රු. 3,633,909 ක් වැය කර තිබුණි.

(ඈ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණ / උපදෙස්වලට අනුව කටයුතු නොකිරීම පහත දැක්වේ.

| | විගණන ඡේදය | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණය/උපදේශය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| (i) | විශ්වවිද්‍යාලයීය භූමිය තුළදී කෘෂිවිද්‍යාපීඨයේ පීඨාධිපතිවරයාගේ පුද්ගලික වාහනයට වූ හානියක් වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ මුදලින් රු.60,000 ක් ගෙවීම. | එකී මුදල නැවත පියවා ගැනීම හා ඒ සම්බන්ධව සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම. | උපදෙස් පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ii) | කොන්ත්‍රාත්කරුවකු වෙත ලබා දී තිබු රු.2,225,981 ක ප්‍රාරම්භක වියදම් කොන්ත්‍රාත්කරු අදාල කටයුතු ඉටුනොකිරීම හේතුවෙන් නැවත අයකර ගැනිම. | උකස් ඇපකරය තැබූ බැංකුව එම මුදල නොපියවීම මත විශ්වවිද්‍යාලය විසින් අදාල බැංකුවට එරෙහිව නිතිමය පියවර ගැනීම. | නීතිමය පියවර ගෙන නොතිබුණි. |
| (iii) | ලඝුලේඛක (ii) ශ්‍රේණියේ තනතුරක් දරන ලද නිලධාරිණියකගේ ණය මුදල වන රු.1,993,082 ක් නොපියවා විදේශ | නිතිමය පියවර ගැනිම. | නීත්‍යානුකූල පියවර ගෙන නොතිබුණි. |

ගත වීම හා සේවයෙන් ඉවත් වීම.

3.3 නිෂ්කාර්ය ඌන උපයෝජන වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යවහාරික විද්‍යා පීඨයේ දේශන පැවැත්වීමට භාවිතා කළ වපසරිය වර්ග අඩි 7,926 ක් වූ ගොඩනැඟිලි 06 ක් 2013 ජූනි 24 දින වන විටද නිෂ්කාර්යව පැවතුණි.

(ආ) වටිනාකම රු.4,360,206 ක් වූ යන්ත්‍රෝපකරණ 03 ක් වර්ෂ 02 ක කාලයක්ද, වටිනාකම රු.749,472 ක් වූ යන්ත්‍රයක් මාස 06 ක කාලයක සිටද නිෂ්කාර්යව පැවතුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පීඨ 02ක මහාචාර්ය තනතුරු 04 ක් සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ මූල්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී යන තනතුරුවල හා අභ්‍යන්තර විගණන ඒකකයේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 01 ක් සම්පූර්ණ කිරීමට විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය අසමත් වී තිබුණි.

04. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 සංයුක්ත සැළැස්ම

2003 ජූනි 02 දිනැති අංක පී.ඊ.ඩී./12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව 2011 සිට 2015 වර්ෂ සඳහා සංයුක්ත සැළැස්ම සකස් කර තිබුණ ද ඒ සඳහා කාලානුරූපීව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

4.2 ක්‍රියාකාරී සැළැස්ම

සංයුක්ත සැළැස්මේ ඇතුළත් දෑ ඉටුකර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබුණි.

05. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා විගණන විමසුම් මගින් වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා ගේ අවධානයට යොමු කෙරිණි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) විදේශ නිවාඩු අනුමත කිරීම
(ඈ) නේවාසිකාගාර කුලියට ගැනීම
(ඉ) වාහන පාලනය